Exammood

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

5

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, AUGUST 2017

# පාසල්වලට සිසුන් තෝරාගැනීම සහ ශිෂ්‍යත්වාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2017 අගෝස්තු

## I පත්‍රය

මිනිත්තු 45 යි.

විභාග අංකය ..................................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:**

* ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත ලියන්න.**
* **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **40**ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු **හතර** බැගින් දී ඇත. ඒවා අතුරෙන්, එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි **පිළිතුර තෝරාගෙන එට යටින් ඉරක් අඳින්න.**
* කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**


| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| එකතුව | |
| **අවසාන ලකුණ** | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |


| | කේත අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක** ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක** පළමු පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක** ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක** අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය. | V/I/S/CH |

[දෙවැනි පිටුව බලන්න


● අංක **1** සහ **2** ප්‍රශ්නවල මුලින් දී ඇති රූපය සම්පූර්ණ කිරීමට ගැළපෙන කොටස තෝරන්න.

**1.**






(1)





(2)




(3)

**2.**






(1)




(2)




(3)

● අංක **3** සහ **4** ප්‍රශ්නවල අනෙක් රූප දෙකට වඩා වෙනස් රූපය තෝරන්න.


**3.**



(1)




(2)




(3)


**4.**



(1)



(2)



(3)

● අංක **5** සහ **6** ප්‍රශ්නවල දී ඇති ඒවායින් තුනක් එක් කාණ්ඩයකටත්, දෙකක් තවත් කාණ්ඩයකටත් වෙන් කළ හැකි ය. එම කාණ්ඩ දෙකෙන් එකකටවත් අයත් **නො වන්නේ** කුමක් ද?

**5.** ජනවාරි, පෙබරවාරි, මාර්තු, අප්‍රේල්, මැයි, ජූනි

(1) පෙබරවාරි (2) අප්‍රේල් (3) ජූනි

**6.** ලීටරය, මීටරය, කිලෝමීටරය, කිලෝග්‍රෑමය, ග්‍රෑමය, සෙන්ටිමීටරය

(1) මීටරය (2) ලීටරය (3) ග්‍රෑමය

EXAMMOOD.LK EXAMMOOD.LK

විභාග අංකය.................................

278399

4. පහත සඳහන් එක් එක් වාක්‍යයේ තද කළු අකුරුවලින් ඇති යෙදුමට වඩාත් ගැළපෙන අදහස වරහන් තුළින් තෝරාගෙන **ඊට යටින් ඉරක් අඳින්න.**

(i) පාසල් ගොස් එන අතර මඟදී පුනිමල් **හා කපන වැස්සකට** හසු විය.
(ධාරානිපාත වර්ෂාවකට / අකල් වර්ෂාවකට)

(ii) පාසලේ අධ්‍යාපන චාරිකාව පිටත් වන දිනය උදාවන තුරු සිසුහු **ඇඟිලි ගණන් කරමින්** සිටියහ.
(නොඉවසිල්ලෙන් / බලාපොරොත්තුවෙන්)

5. පහත සඳහන් වගන්තිවල හිස්තැනට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරාගෙන **ඊට යටින් ඉරක් අඳින්න.**

(i) 'සිනා උපදවන' යන අදහස ප්‍රකාශ කෙරෙන තනි වචනයකි, ...................... .
(ජුගුප්සාජනක / හාස්‍යජනක)

(ii) "හිරෙන් හිරට පැන ලැගුම් සොයා පුබුදිමින් අරුණ කළමා
ගොර දෙමින් නැවත වට පිටින් බලති නොක උගුළු විහිළු පුදුමා"

මෙම කවි දෙපදයෙන් කියැවෙන්නේ ........................... (වඳුරකුගේ / අශ්වයකුගේ) ගමන් විලාසය පිළිබඳව ය.

6. පහත සඳහන් කවියේ ඇති **හිස්තැන සම්පූර්ණ කරන්න.**

සොම්නස හෝ සන්තාපය හමුවේ
සිහි වේ සිහි වේ අම්මා
...........................................................
නිම කළ පිළිරුව අම්මා

7. පහත සඳහන් ස්ත්‍රී ලිංග නාම පදයට ගැළපෙන පුරුෂ ලිංග නාම පදය **තිත් ඉර මත ලියන්න.**

යෙහෙළිය :.........................

8. පහත සඳහන් වාක්‍යයේ **සුදුසු තැන්වලට විරාම ලකුණු යොදන්න.**

අපොයි දෙවියනේ මේ අවනඩුව කාට කියන්නද

9. පහත සඳහන් කවිය කියවා අසා ඇති ප්‍රශ්නයට පිළිතුර **තිත් ඉර මත ලියන්න.**

කිසි විටක අලස ව නැතී
මුළු දවස නිති වෙහෙසෙතී
නරන් මෙන් ගැටුමක් නැතී
එකා මෙන් සැම වැජඹෙතී

නිතරම මහන්සි වී වැඩ කරන බව වඩාත් හොඳින් ප්‍රකාශ කෙරෙන පද පේළිය මෙම කවියෙන් උපුටාගෙන ලියන්න.

...........................................................

10. පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළේ **ඉතිරි කොටස සම්පූර්ණ කරන්න.**

සූලා නැති වළට ...............................................

**11.** පහත දී ඇති එක් එක් සිංහල වචනය සඳහා යෙදෙන ඉංග්‍රීසි වචනය **ඉංග්‍රීසි අකුරුවලින්** ලියන්න.

(i) මහට : ..............................

(ii) දේදුන්න : ..............................

**12.** පහත දී ඇති එක් එක් ඉංග්‍රීසි වාක්‍යයේ හිස්තැනට සුදුසු වචනය කොටුව තුළ දී ඇති වචනවලින් තෝරාගෙන **හිස්තැන් සම්පූර්ණ කරන්න.**

| | |
|---|---|
| bakery | hospital |
| market | post office |

(i) We buy stamps from the ..............................

(ii) We buy vegetables from the ..............................

**13.** පහත සඳහන් වාක්‍යය ඉංග්‍රීසි භාෂාවෙන් කියන ආකාරය **ඉංග්‍රීසි අකුරුවලින්** ලියන්න.

මට බඩගිනියි. : ..............................

**14.** පහත සඳහන් **දෙමළ වචනයේ අර්ථය සිංහලෙන්** ලියන්න.

සිට්රුණ්ඩිච්චාලෛ : ..............................

**15.** පහත සඳහන් වාක්‍යය **දෙමළෙන් කියන ආකාරය සිංහලෙන්** ලියන්න.

මම පාඩම් කරනවා. : ..............................

**16.** නැගෙනහිර අහසේ පායා එන හිරුගේ ළා රැස් දහරින් මුළු ලොවම නැහැවෙද්දී ලොවට තවත් අලුත් දවසක් උදාවෙයි. උදාවන එම සුන්දර උදෑසන අපගේ ගතත් සිතත් ප්‍රබෝධමත් කරයි. අවට පරිසරයේ නැවුම් සුන්දරත්වයක් මැවෙයි. "උදෑසනක සුන්දරත්වය" යන මාතෘකාව පිළිබඳ ව වාක්‍ය **තුනක්** ලියන්න. (සෑම වාක්‍යයක ම, **වචන පහකට වඩා වැඩියෙන් තිබිය යුතුයි. උක්ත / ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුයි.**)

* ..............................................................................................

..............................................................................................

* ..............................................................................................

..............................................................................................

* ..............................................................................................

..............................................................................................

● **දී ඇති හිස් ඉරි මත පිළිතුරු ලියන්න.**

**17.** "නිදහස් අනුනාමය" යන සංඛ්‍යාවට එකක් එකතු කළ විට ලැබෙන සංඛ්‍යාව **ඉලක්කමෙන්** ලියන්න.

..............................

**18.** මෙම කොටුව තුළ ඇති සංඛ්‍යා අතුරෙන් 9න් ඉතිරි නැතිව බෙදෙන සංඛ්‍යාව කුමක් ද? : ..............................

| | |
|---|---|
| 399 | 578 |
| 451 | 675 |


**19.** ඉරටු කැබැලි 5ක් යොදාගෙන සුපුන්, රෝම සංඛ්‍යාංකවලින් 8 සංඛ්‍යාව නිරූපණය කරයි. ඒ අනුව, 20ට අඩු සංඛ්‍යාවක් රෝම සංඛ්‍යාංකවලින් නිරූපණය කිරීමට සුපුන්ට ඉරටු කැබැලි 7ක් අවශ්‍ය විය.

එම සංඛ්‍යාව රෝම සංඛ්‍යාංකවලින් ලියන්න. ..............................

[පස්වැනි පිටුව බලන්න.


EXAMMOOD.LK

මෙහි දැක්වෙන්නේ වර්ගඵලය වර්ග සෙන්ටිමීටර 1 බැගින් වන සමචතුරස්‍ර 10කින් සමන්විත රූපයකි.



මෙම රූපයේ අඳුරු කර ඇති කොටසේ වර්ගඵලය, මුළු වර්ගඵලයෙන් කුමන භාගයක් ද? ..........................


21. පහත දැක්වෙන හැඩතල යොදාගෙන සෑදිය හැකි ඝනවස්තු **දෙක** මොනවා ද?



(i) ..........................................

(ii) ..........................................

22. (i) මෙම රූපයේ අඳුරු කර ඇති කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.



:..................................

(ii) $\frac{3}{5}$, $\frac{1}{2}$, 0.3, $\frac{7}{10}$ යන සංඛ්‍යා අතුරෙන් **කුඩා ම** සංඛ්‍යාව කුමක් ද?

:..................................


23. පසිඳු පස්වරු 1.15ට තමාගේ නිවසින් පිටත් වී පස්වරු 2.40ට පුස්තකාලයට ළඟා විය.

(i) නිවසේ සිට පුස්තකාලයට යාමට පසිඳුට ගත වූ කාලය පැය හා මිනිත්තුවලින් කොපමණ ද?

: පැය ............... මිනිත්තු ...............

(ii) පසිඳු පුස්තකාලයට ළඟා වන විට වේලාව, පැය විසිහතරේ ඔරලෝසුවෙන් දැක්වෙන ආකාරයට ඉලක්කමෙන් ලියා දක්වන්න. ..........................................

24.




මෙම රූපයේ දැක්වෙන කම්බි රාමුවේ,

(i) a, b, c හා d ලෙස නම් කර ඇති කම්බි කූරු හතරේ මුළු දිග සෙන්ටිමීටර කීය ද? ..............................

(ii) කම්බි රාමුවේ පරිමිතිය සෙන්ටිමීටර කීය ද? ..........................

25. භාජනයක අල්ලන මී පැණි පරිමාව ලීටර 3 කි. එහි ලීටර 1 මිලිලීටර 800 ක ප්‍රමාණයක් මී පැණිවලින් පුරවා ඇත.

(i) මෙම භාජනය සම්පූර්ණයෙන් පිරවීම සඳහා තවත් අවශ්‍ය වන මී පැණි ප්‍රමාණය ලීටර හා මිලිලීටරවලින් කොපමණ ද?

ලීටර ............... මිලිලීටර ..................

(ii) භාජනයේ දැනට ඇති මී පැණි ප්‍රමාණයෙන් ධාරිතාව මිලිලීටර 150 බැගින් වූ බෝතල් කීයක් පිරවිය හැකි ද?

.................................................................

EXAMMOOD.LK
EXAMMOOD.LK

**26.** එක්තරා වෙළෙඳසැලකින් සීනි කිලෝග්‍රෑම් 1 ග්‍රෑම් 750 ක් මිලදී ගැනීම සඳහා නිපුනි ගෙවූ මුදල රුපියල් 210කි. එම මුදල ගෙවීම සඳහා රුපියල් 500 නෝට්ටුවක් දුන් නිපුනිට ඉතිරි මුදල වශයෙන් ලැබුණේ එකම වර්ගයේ නෝට්ටු 5ක් හා එකම වර්ගයේ කාසි 4කි.


(i) මෙම වෙළෙඳසැලේ සීනි කිලෝග්‍රෑම් 1ක මිල රුපියල් කීය ද? : ..............................

(ii) ඉතිරි මුදල වශයෙන් නිපුනිට ලැබුණු,

(අ) නෝට්ටු පහේ මුළු වටිනාකම රුපියල් කීය ද? : ..............................

(ආ) කාසි හතරේ මුළු වටිනාකම රුපියල් කීය ද? : ..............................

**27.**





මෙම ගණක රාමුවේ,

(i) නිරූපණය කරන සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න. ..............................

(ii) C කූරේ ඇති මුදු මගින් නිරූපණය කරන අගය කීය ද? ..............................

**28.** කුමුදු එක්තරා ස්ථානයකින් ගමන් ආරම්භ කර මීටර 100ක් නැගෙනහිර දිශාවට ගමන් කරයි. අනතුරුව රූපයේ දැක්වෙන ආකාරයට එතැනින් දකුණු අත පැත්තට හැරී නැවත් මීටර 100ක් ගමන් කරයි.




(i) කුමුදු දැන් සිටින්නේ ආරම්භක ස්ථානයේ සිට කුමන දිශාවෙන් ද? ..............................


(ii) නැවතත් ආරම්භක ස්ථානයට ම යාමට නම්, නවත් අවස්ථා කීයකදී දකුණු අත පැත්තට හැරී මීටර 100ක් බැගින් ඉදිරියට ගමන් කළ යුතු ද? ..............................

**29.** ගෙඩි 120ක් තිබුණු අඹ ගොඩකින් $\frac{3}{8}$ ක් නරක් වූ නිසා ඉවත් කරන ලදී. ඉතිරි හොඳ අඹ ගෙඩි සංඛ්‍යාව, පාලිකා, ශාලිකා හා නාලිකා යන මිතුරියන් තිදෙනා අතර සමානව බෙදන ලදී.

(i) ගොඩේ තිබුණු හොඳ අඹ ගෙඩි සංඛ්‍යාව කීය ද? : ..............................

(ii) එක් මිතුරියකට ලැබුණු අඹ ගෙඩි සංඛ්‍යාව කීය ද? : ..............................

**30.** A, B, C, D හා E ලෙස නම් කර ඇති හැඩතල පහක් පහත රූපයේ දැක්වේ.




මෙම හැඩතල අතුරෙන්,

(i) සමමිතික රේඛා **අඩු ම** සංඛ්‍යාවක් ඇඳිය හැකි හැඩතලයට අදාළ ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද? : ..............................

(ii) සමමිතික රේඛා **වැඩි ම** සංඛ්‍යාවක් ඇඳිය හැකි හැඩතලයට අදාළ ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද? : ..............................



EXAMMOOD.LK
EXAMMOOD.LK

- ප්‍රශ්න අංක **31** සිට **60** තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර, දී ඇති පිළිතුරු අතුරෙන් තෝරාගෙන **ඊට යටින් ඉරක් අඳින්න.**

**31.** වියළාගත් මල් තැම්බීමෙන් ඖෂධීය පානයක් පිළියෙල කිරීමට යොදා ගනු ලබන ශාකයකි.
(1) රණවරා (2) කෝපි (3) කොත්තමල්ලි (4) තේ

**32.** කුඹුරු ගොවිතැනේදී භාවිත කරනු ලබන උපකරණ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) උදැල්ල, සකපෝරුව, වියගහ (2) වියගහ, දැකැත්ත, නගුල
(3) නගුල, සෙක්කුව, ඇඹි පෝරුව (4) අතංගුව, උදැල්ල, දැකැත්ත

**33.** ශ්‍රී ලංකාවේ මුහුදු වෙරළක් පිහිටන පළාතකි.
(1) සබරගමු පළාත (2) මධ්‍යම පළාත (3) ඌව පළාත (4) වයඹ පළාත

**34.** විද්‍යුත් චුම්බකයක් භාවිත කෙරෙන නිර්මාණයකි.
(1) හුමාල බෝට්ටුව (2) චුම්බක දිශා දර්ශකය (3) විදුලි සීනුව (4) සිදුරු කැමරාව

**35.** ජලයේ ඇතිය හැකි ලක්ෂණයක් **නො වන්නේ,**
(1) නිශ්චිත හැඩයක් තිබීම ය. (2) රත් කිරීමේදී හුමාලය පිටවීම ය.
(3) කොන්ඩිස් කුඩු මගින් වර්ණ ගැන්වීම ය. (4) සිසිල් කළ විට අයිස් බවට පත්වීම ය.

**36.** අමුවෙන් කපාගත් කැබලි කිහිපයක් දැමීමෙන් භාජනයක ඇති ජලය වර්ණ ගැන්විය හැකි එළවළු වර්ගයකි.
(1) වම්බටු (2) වට්ටක්කා (3) කැරට් (4) බීට්රූට්

**37.** ඉහළ අහසේ පියාසර කරන තියුණු ඇස් යුගලක් සහිත මාංශභක්ෂක පක්ෂියෙකි.
(1) ඇටිකුකුළා (2) උකුස්සා (3) බකමූණා (4) වැහිළිහිණියා

**38.** සුළඟ මගින් වැඩි වශයෙන් පාංශු ඛාදනයට ලක් වන්නේ,
(1) උස් ශාක සහිත වනාන්තර ප්‍රදේශ ය. (2) ගොඩනැගිලි බහුල නාගරික ප්‍රදේශ ය.
(3) තණ කොළ නොමැති වැලි සහිත ප්‍රදේශ ය. (4) තේ පඳුරු සහිත කඳුකර ප්‍රදේශ ය.

**39.** පහත සඳහන් තරු රටා අතුරෙන් වැඩිම තරු සංඛ්‍යාවක් අයත් වන තරු රටාව කුමක් ද?
(1) දඩයක්කාරයා (2) මහවලහා (3) දකුණු කුරුසිය (4) ගෝනුස්සා

**40.** "ඉත්තේ දුඹුරයි මහ කළු ගලක් යට – කන්නේ කරවලයි රට හාලේ බතට" යන කවිය,
(1) ගොයම් කවියකි. (2) කරත්ත කවියකි. (3) පාරු කවියකි. (4) පතල් කවියකි.

**41.** නෝට්ටු මුහුණතේ නොරොච්චෝලෙයි විදුලි බලාගාරය දැක්වෙන ශ්‍රී ලංකා මුදල් නෝට්ටුව,
(1) රුපියල් 20 වේ. (2) රුපියල් 50 වේ. (3) රුපියල් 100 වේ. (4) රුපියල් 500 වේ.

**42.** ශ්‍රී ලංකාවට වඩාත් ආසන්නව පිහිටා ඇති රටවල් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) මාලදිවයින, නේපාලය, භූතානය (2) පාකිස්ථානය, ජපානය, බංග්ලාදේශය
(3) ඉන්දියාව, රුසියාව, නේපාලය (4) බංග්ලාදේශය, චීනය, මාලදිවයින

**43.** කෘත්‍රිම වර්ණක හා රසකාරක යොදන ලද ආහාර භාවිතයෙන් ඇති විය හැකි රෝගයකි.
(1) ජලභීතිකාව (2) පිළිකා (3) උණසන්නිපාතය (4) දියවැඩියාව

**44.** ඩෙංගු රෝගයෙන් ආරක්ෂා වීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ගයකි.
(1) උණු කර නිවාගත් ජලය පානය කිරීම (2) පිසූ ආහාර හොඳින් වසා තැබීම
(3) අවට පරිසරය පිරිසිදු කිරීම (4) එළවළු වැඩිපුර ආහාරයට ගැනීම

**45.** අපේ රටේ පොදු ප්‍රවාහන බස් රථයක පූජ්‍ය පක්ෂයට හැරුණු විට මඟී ආසන වෙන්කර ඇති අනෙක් පුද්ගල කාණ්ඩ **දෙක** මොනවා ද?
(1) ළදරුවන්, රෝගීන් (2) රෝගීන්, පාසල් සිසුන්
(3) ආබාධිතයින්, ගැබිනි මව්වරුන් (4) වයස්ගත වැඩිහිටියන්, ආබාධිතයින්



EXAMMOOD.LK

46. තවාන්වලින් පැළ ලබාගෙන පාත්තිවල සිටුවනු ලබන බෝග වර්ග පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) බෝංචි, බණ්ඩක්කා, නිවිති (2) බෝංචි, තක්කාලි, මාළුමිරිස්
(3) වම්බටු, නිවිති, තක්කාලි (4) මාළුමිරිස්, වම්බටු, තක්කාලි

47. මාර්ග වර්ණ සංඥා පුවරුවක ඉහළ සිට පහළට වර්ණ සංඥා පිහිටන නිවැරදි අනුපිළිවෙළ තෝරන්න.
(1) රතු, කහ, කොළ (2) කොළ, කහ, රතු
(3) කහ, රතු, කොළ (4) කහ, කොළ, රතු

48. 'මයිනහම' භාවිත කරන්නේ,
(1) වඩුවා ය. (2) ධීවරයා ය. (3) පෙදරේරුවා ය. (4) කම්මල්කරුවා ය.

49. සුළඟ ආධාරයෙන් ක්‍රියා කරන සංගීත භාණ්ඩයකි.
(1) බුම්මැඩිය (2) හොරණෑව (3) දවුල (4) උඩැක්කිය

50. ශ්‍රී ලංකාවේ සෑම රජයේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවකටම නොමිලයේ රජයෙන් ලබා දෙන්නේ,
(1) නිල ඇඳුම හා දිවා ආහාර ය. (2) දිවා ආහාර හා පෙළපොත් ය.
(3) පෙළපොත් හා නිල ඇඳුම් ය. (4) ශිෂ්‍යාධාර හා දිවා ආහාර ය.

51. පිපිරී ඇට වැටීමෙන් ව්‍යාප්ත වන බීජ සහිත ශාකයකි.
(1) බඩ ඉරිඟු (2) හෝර (3) පුවක් (4) මදටිය

52. පිටිය මැද සවිකරන ලද දැලක දෙපැත්තේ සිට කරනු ලබන ක්‍රීඩා **දෙකකි**.
(1) නෙට්බෝල්, බැඩ්මින්ටන් (2) වොලිබෝල්, බැඩ්මින්ටන්
(3) නෙට්බෝල්, බාස්කට්බෝල් (4) වොලිබෝල්, නෙට්බෝල්

53. කුරුටු ගී හා බිතු සිතුවම් දක්නට ලැබෙන ඓතිහාසික ස්ථානයකි.
(1) සීගිරිය (2) යාපහුව (3) ඉසුරුමුණිය (4) ඇම්බැක්ක

54. නිවසක් තුළට ස්වාභාවිකව සිසිල් සුළං ලබා ගැනීමට භාවිත කරනු ලබන ක්‍රමයක් **නො වන්නේ**,
(1) නිවෙස්වලට ජනෙල් සවි කිරීම ය. (2) විදුලි පංකා භාවිත කිරීම ය.
(3) බිත්තියේ ඉහළින් වා කවුළු තැබීම ය. (4) දොර උළුවස්සේ ඉහළ බීරළු සවි කිරීම ය.

55. ශාකවලට හානි කරන සතුන් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) දිමියා, කුහුඹුවා, මී මැස්සා (2) කැරපොත්තා, ගෙමැස්සා, මකුණා
(3) පුරුක් පණුවා, කුඩිත්තා, පිටිමකුණා (4) මකුණා, උකුණා, කිනිතුල්ලා

56. පහත සඳහන් ආහාර ද්‍රව්‍ය අතුරෙන් නිෂ්පාදිත දිනය හා කල් ඉකුත්වීමේ දිනය අතර අඩු ම කාලයක් ඇත්තේ කුමකට ද?
(1) ටින් මාළු (2) යෝගට් (3) ජෑම් (4) චීස්

57. පිටරට වෙසෙන ඔබගේ පැනේ මිතුරෙකු දළදා පෙරහැරේ පින්තූරයක් හැකි ඉක්මනින් එවන ලෙස ඔබගෙන් ඉල්ලීමක් කරයි. මේ සඳහා ඔබට යොදා ගත හැකි වඩාත් ම සුදුසු ක්‍රමය මේවායින් කුමක් ද?
(1) ගුවන් තැපැල (2) මුහුදු තැපැල (3) ශීඝ්‍රගාමී තැපැල (4) විද්‍යුත් තැපැල

58. ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා වශයෙන් වලිකුකුළා තෝරා ගැනීමට ප්‍රධාන හේතුව වන්නේ,
(1) මෙරටේ බහුලව සිටීම ය. (2) මෙරටට ආවේණික වීම ය.
(3) සෑම ප්‍රදේශයකම දක්නට ලැබීම ය. (4) වඩාත් ප්‍රයෝජනවත් වීම ය.

59. අතීතයේ දී අපේ රට යටත් කර ගෙන සිටි විදේශීය ජාතීන් අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) පෘතුගීසීන්, ලන්දේසින්, ඉංග්‍රීසීන් (2) ලන්දේසීන්, පෘතුගීසීන්, ඉංග්‍රීසීන්
(3) ඉංග්‍රීසීන්, පෘතුගීසීන්, ලන්දේසීන් (4) පෘතුගීසින්, ඉංග්‍රීසින්, ලන්දේසීන්

60. "යුතුකම් ඉටු කරන්නට හා පුංචි පුංචි වගකීම් දරන්නට මගේ හිතේ ඇති වුණු උනන්දුව මගේ පවුලේ හැමෝගේම සිත්වලත් ඇති වේවා!" මෙම සිතුවිල්ල සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකමක කුමන පියවරට අයත් වේ ද?
(1) මානසික ලිහිල් බව (2) අධිෂ්ඨානය (3) ප්‍රාර්ථනාව (4) උදානය

* * *

EXAMMOOD.LK EXAMMOOD.LK

278399

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

5

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, AUGUST 2017

**පාසල්වලට සිසුන් තෝරාගැනීම සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2017 අගෝස්තු**

# II පත්‍රය

**පැය 1 යි මිනිත්තු 15 යි.**

විභාග අංකය : ..............................

## විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:

- ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
- **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **60** ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න. (සමහර ප්‍රශ්නවල අනුකොටස් ද ඇත.)
- පිළිතුරු ලියන්නට දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු **තිත් ඉරි මත** ලියන්න.
- පිළිතුරට **යටින්** ඉරක් අඳින්න කියා ඇති විට **ඉරක් පමණක් අඳින්න.**
- පිළිතුරු හතරක් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.**
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

## උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| **අවසාන ලකුණ** | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කේත අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම කළ බව සහතික කරමි. | <br>V/II/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි. | <br>V/II/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | <br>V/II/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය. | <br>V/II/S/CH |

[දෙවැනි පිටුව බලන්න.

EXAMMOOD.LK

**1.** පහත දැක්වෙන ඡේදය හොඳින් කියවන්න.

මේසයට ටිකක් ඈතින් වූ වීදුරු ඉලත්තට්ටුවක මතුයෙහි, සිහසුන අරා හිඳගත් කුමාරයකු මෙන් පිළිවැස්සෙන් වැසී සිටි කිරිමුට්ටිය දෙස බලමින් කුමාරගුප්ත තමා ඉදිරියෙහි වූ සුදු බොකුටු පිඟාන ද හැන්ද ද ඉඳුල් කඩින් දෙතුන් වරක් පිස දැමුවේ ය. ඔහු හැන්ද පිස දැමූ ආකාරයෙන් ද, කල්ල මැරූ විටියෙන් ද, තොල කට ලෙව කෑ සැටියෙන් ද, කිරිමුට්ටිය සම්පූර්ණයෙන් ම වුවත් කා දැමීමට නුපුළුවන් එකෙකැයි කිසිවකුට කිව හැකි නොවී ය. කොළඹ දී දවල් බත කන්ට සිතා ගෙන ඇඳපැලඳ ගත් ඔහු නැවැත්විය හැකි වූයේ දීකිරි මතක් කළ බැවිනි.

ප්‍රශ්නවලට පිළිතුරු ඡේදයෙන් ම තෝරාගෙන, **තිත් ඉරි මත ලියන්න.**

(i) ඡේදයෙන් කියැවෙන ආකාරයට කිරිමුට්ටිය තබා තිබුණේ කුමක් මත ද?

........................................................................................................

(ii) දවල් බතට කොළඹ යාමට සූදානම් වූ කුමාරගුප්ත නැවැත්විය හැකි වූයේ කෙසේ ද?

........................................................................................................

(iii) කුමාරගුප්ත ඉඳුල් කඩින් පිස දමන ලද පිඟානේ හැඩහුරුකම ඡේදයේ විස්තර කර ඇත්තේ කෙසේ ද?

........................................................................................................

(iv) 'නොහැකි' යන අර්ථයට සමාන අදහසක් ගෙන දෙන වචනයක් ඡේදයේ සඳහන් වේ. එම වචනය කුමක් ද?

........................................................................................................

(v) 'නැත' යන අර්ථය හැඟවෙන අතීත කාල ඒකවචන ක්‍රියා පදයක් ඡේදයෙන් තෝරා ලියන්න.

........................................................................................................

(vi) ඡේදයෙහි සඳහන් උපමාව ලියන්න.

........................................................................................................

**2.** පහත සඳහන් වාක්‍යවල හිස්තැනට ගැළපෙන වචනය වරහන් තුළින් තෝරාගෙන **ඊට යටින් ඉරක් අඳින්න.**

(i) කිරි බණ්ඩා .................. (පලතුරු / පළතුරු) ගස්වල ගෙඩි කන වඳුරන් පළවා හරියි.

(ii) බෙහෙතක් සැකසීමට කොළ වර්ග කිහිපයක් සොයා ගැනීමේ අදහසින් හේරත්හාමි .................. (වනයට / වණයට) ගියේ ය.

**3.** පහත සඳහන් එක් එක් වාක්‍යයේ උක්ත/ආඛ්‍යාත සම්බන්ධය **නිවැරදි නම් (√ ) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද** ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

(i) ගොයම් කපා අවසන් කළ ගොවියෝ කමතේ ගස් සෙවණේ ඉඳ ගත්හ. (.........)

(ii) මද පුළඟට ගස් සෙලවෙති. (.........)

(iii) මී මැස්සෝ මලින් මලට ගොස් පැණි උරා බොති. (.........)

(iv) ඔල්වරසන් හඬ මැද ක්‍රීඩිකාවෝ තරගය නිම කළා ය. (.........)

[අනෙක් පිටුව බලන්න.

විභාග අංකය ..................................

278399

- අංක 7 සහ 8 ප්‍රශ්න සඳහා △ = 2, ▲ = 3, □ = 5, ■ = 6, ✳ = 8 ලෙස යොදා ගෙන හිස්තැනට සුදුසු පිළිතුර තෝරන්න.

**7.**

  □ △
\+ ▲ ■
..........


(1) △ △     (2) ■ ■     (3) ✳ ✳

**8.**

  ✳ ■ □
− □ ▲ △
..........

(1) ▲ ▲ ▲     (2) ■ ■ ■     (3) △ △ △

**9.** පහත එක් එක් රූපයේ ඇතුළත් සෘජුකෝණ සංඛ්‍යාව වැඩිවන අනුපිළිවෙළට පෙළගස්වා ඇති පිළිතුර තෝරන්න.





(1) A, B, C     (2) A, C, B     (3) B, C, A

**10.** පහත වගුවේ දැක්වෙන අයගෙන් වයසින් අඩු ම තැනැත්තිය හා වයසින් වැඩි ම තැනැත්තිය අනුපිළිවෙළින් තෝරන්න.

| නම | උපන් දිනය |
|---|---|
| මාධවී | 2006.06.13 |
| රේවතී | 2007.10.02 |
| පාතිමා | 2006.04.28 |
| සමාධී | 2007.05.20 |

(1) පාතිමා, රේවතී
(2) සමාධී, මාධවී
(3) රේවතී, පාතිමා

**11.** පහත සඳහන් රූපවල ඇති සංඛ්‍යා රටාව අනුව හිස්තැනට තිබිය යුතු සංඛ්‍යාව තෝරන්න.




(1) 3
(2) 4
(3) 5

**12.** පහත දී ඇති සංවාදය කියවන්න.

A - ඉස්කෝලේ යන්නේ කොහොම ද? තෙමෙන්නයි වෙන්නේ.
B - අදත් වහීවි ද? අහස නම් කළු කරලා.
C - අමතක නොකර කුඩය අරන් යන්න.
D - ඊයේ දවසම වැස්සා. අදත් වහින පාටයි.

මෙම සංවාදය වඩාත් සුදුසු අනුපිළිවෙළට පෙළගස්වා ඇති පිළිතුර තෝරන්න.

(1) A, D, C, B     (2) B, D, A, C     (3) C, D, B, A



EXAMMOOD.LK
EXAMMOOD.LK